**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය - 2020**

**-------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ("අධිකාරිය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය වාර්තා ප්‍රමාදවීම හේතුවෙන් අධිකාරිය සම්බන්ධ ගණුදෙනු පිළිබඳ වාර්තාව 2023 පෙබරවාරි 09 දින භාෂාත්‍රයෙන් යුතුව පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07 අනුව වක්‍ර ක්‍රමයට අනුව වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ගැලපීම් ලෙස සටහන් කල යුත්තේ, බදු පෙර ලාභය ගණනය කිරීමේදී ගිණුම් ගත කරන ලද මුදලින් සිදු නොවූ ගනුදෙනුය. නමුත් ස්කන්ධය වෙන්වීමේ ප්‍රකාශයෙහි ගලපා ඇති පෙර වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් වටිනාකම වූ රු.1,654,913ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ගැලපීම් යටතේ අඩුකර දක්වා තිබුණි. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 හි 49 ඡේදය අනුව පෙර වර්ෂයට අදාල මෙම වැරදි නිවැරදි කිරීම් සම්බන්ධ තොරතුරු මූල්‍ය ප්‍රකාශවල හෙළිදරව් කර නොතිබුණි. | 2021 වසරට අදාල අවසාන ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව කටයුතු කල යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය අනුව දේපළ පිරියත හා උපකරණ වසර 3 කට හෝ 5කට වතාවක් ප්‍රත්‍යාගණනය කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.24,168,892ක් වූ මෝටර් රථ, | මේ වන විට ආයතනය සතු සියලුම ස්ථාවර වත්කම් විශ්ලේෂණය කොට නැවත ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. ඒ අනුව, අදාළ ප්‍රත්‍යාගණන කටයුතු වසර 4කට වරක් වන පරිදි සිදු | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.1,652,421ක් වු කාර්යාල උපකරණ, රු.7,166,093ක් වු කාර්යාල ලීබඩු, රු.5,873,613ක් වු පරිගණක හා උපාංග හා රු.1,192,332ක් වු පිරියත හා යන්ත්‍ර සූත්‍ර දීර්ඝ කාලයකින් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. එම නිසා ප්‍රත්‍යාගණනයෙන් පසු ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38 අනුව අස්පෘශ්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතු වුවත්, රු.500,000ක් වැයකර ස්ථාපනය කර ඇති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතිය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා නොගෙන වැඩසටහන් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | ලබන වසරේ සිට ප්‍රාග්ධනිත අයිතම ලෙස සටහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් වටිනාකම පිළිවෙලින් රු.645,744ක් හා රු.7,737,500ක් වූ කාර්යාල ලීබඩු හා ටැබ් පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ක්ෂය වියදම හා ක්ෂය වෙන්කිරීම් පිළිවෙලින් රු.64,574කින් හා රු.1,934,375කින් ඌනගණනය වී තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදි ක්ෂයවීම සිදුකර ඇත. ඉදිරියේදී මෙවැනි වැරදීම් සිදු නොකිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාල ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කල යුතුය. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| B Express Ltd. ආයතනයෙන් වසරක සිට ලැබිය යුතුව පවතින රු.170,712ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | B Express Ltd ආයතනය 2023 වර්ෂයේ ප්‍රතිව්‍යුහගත කර ඇති අතර ලැබිය යුතු මුදල අයකර ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. රු.2,182,904ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,753,223ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.570,319ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වර්ෂය තුළ පරිපාලන වියදම් රු.1,083,387කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යවසායකයින්ට අවශ්‍ය වන තොරතුරු ඇතුළත් ව්‍යාපාර සංවර්ධන සේවා සැපයුම් නාමාවලියක් (Business Development Service Provider Directory) රු.852,070ක් වැයකර ඉංග්‍රීසි හා දෙමළ භාෂාවෙන් පිටපත් 500 බැගින් මුද්‍රණය කර තිබුණි. මෙම නාමාවලි බෙදාහැරීම සඳහා බෙදාහැරීමේ සැලැස්මක් නොතිබුණ අතර, මෙම වාර්තාවෙහි දිනය වන විට ඉංග්‍රීසි භාෂා පිටපත් 68ක් ඉතිරිව තිබූ අතර ඒවා නිසි පරිදි ගබඩා කර නොතිබුණි. තවද ඉතිරිව ඇති දෙමළ භාෂා පිටපත් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි. | මෙම මුද්‍රිත පිටපත් අධිකාරිය මගින් ක්‍රියාත්මක කල වෙළඳ සල්පිල් වල හඳුනාගත් සුදුසු ව්‍යවසායන් වෙත ලබාදුන් අතර ඉතිරිව පවතින මුද්‍රිත පිටපත් ඉදිරි කාලය තුල අවශ්‍යතාවය පවතින ව්‍යවසායකයින් වෙත වෙළඳ සල්පිල් හා සංවර්ධන වැඩසටහන් තුලදී ලබාදීමට අධිකාරිය සැලසුම් කරයි. | අවශ්‍යතාව හඳුනාගෙන පිටපත් මුද්‍රණය කල යුතු අතර බෙදාහැරීමේ සැලැස්මකට අනුව ක්‍රමානුකූලව බෙදාහැරීම සිදුකල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2020 හා 2021 වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |